ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 2 වන මට්ටම
අවසාන පරීක්ෂණය
අධ්‍යයන වර්ෂය - 2007
දේශපාලන විද්‍යාවේ මූලිකාංග - SSF 2301

කාලය : පැය තුනයි (03)

දිනය : 2007.10.08 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරක් සඳහාම ලකුණු විස්සක් (20) ලැබේ.

1. රාජ්‍යයක ස්වභාවය, සංයුතිය සහ කාර්යයන් විස්තර කරන්න.

2. (අ) රාජ්‍යයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක වැදගත්කම කුමක්ද?
   (ආ) සන්ධිය ආණ්ඩුක්‍රමයක් තුළ තිබෙන්නාවූ ලක්ෂණ පැහැදිලි කරන්න.

3. ශ්‍රී ලංකාවේ දේශපාලනික සංවර්ධන ක්‍රියාවලියට ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඉවහල්වූ ආකාරය සාකච්ඡා කරන්න.

4. පළමු ජනරජ ව්‍යවස්ථාව සෝල්බරී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.

5. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන විධායක ජනාධිපති තනතුරේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

6. ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක පැහැදිලි කරන්න.

7. (අ) ලංකා ජාතික ව්‍යාපාරයේ අරමුණු පැහැදිලි කරන්න.
   (ආ) සූරියමල් ව්‍යාපාරයේ ආරම්භය සහ වර්ධනය විස්තර කරන්න.

8. 1833 කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණවල වැදගත්කම පැහැදිලි කරන්න.

9. පහත සඳහන් මාතෘකාවලින් තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   1. ජනමත විචාරණය
   2. ස්වාධිපත්‍යය
   3. මානව අයිතිවාසිකම්
   4. පරිපාලන කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)
   5. බලය බෙදාහැරීම

***** සියළුම හිමිකම් ඇවිරිණි *****